KIDS GOD WORSHIP
www.kidworship.kr

# යාකොබ් 1

– 9th Story–


59Page

පොතේ ගුරා ඊසාක් සහ රෙබෙකාට නිවුන් පුතුන් සිටියා. වැඩිමහල් පුතාගේ නම ඒසව්. ඔහුගේ ඇඟ රතු පාටට රෝම වලින් පිරී තිබුණා.
ඔහුගේ සහෝදරයා මවු කුසින් පිටතට එද්දිම ඒසව්ගේ විලුඹ අල්ලාගෙනම ආව නිසා ඔහුට යාකොබ් කියා නම තැබුවා.
යාකොබ් හා ඒසව් එකට ඉපදුණාට ඔවුන් දෙදෙනාම එකිනෙකාට වෙනස් වුණා. ඒසව් ගොඩාක් ශක්තිමත් හා කඩිසරයි.
ඔහු කුඹුරේ වැඩ වලට ගොඩාක් කැමති වූ අතර පරිසරයේ එහා මෙහා දුවන්නට කැමතිව සිටියා. ඒසව් ලොකු වී දක්ෂ දඩයක්කාරයෙක් වුණා.
ඔහුගේ පියා ඒසව්ට ගොඩාක් ආදරය කළා. ඒ වගේම යාකොබ් නිෂ්ශබ්දයි. ගෙදරම ඉන්න කැමති කෙනෙක්. ගෙදර බැටළුවන් බලාගෙන සිටියා. ඔහුගේ මව රෙබෙකා ඔහුට ගොඩාක් ආදරේ කළා.

..................................................................................................


60Page

පොතේ ගුරා එක දවසක් යාකොබ් සුප් එකක් හදාගෙන සිටියා. ඒසව් දඩයම් කර බඩගිනි වෙලා ගෙදරට ආවා. එතකොට මෙහෙම කිව්වා.

ඒසව් යාකොබ් මට ඔය සුප් එකෙන් ටිකක්"දෙන්නකෝ.

යාකොබ් ඔයා ඔයාගේ කුලුදුල්කම මට දුන්නොත් මම ඔයාට සුප් එකෙන් දෙනවා.

ඒසව් මගේ කුලුදුල්කම ?? හරි කමක් නෑ.
මම මේ බඩගින්නෙන් මැරුණොත්ඎ මගේ මේ කුලුදුල්කමෙන් ඇති එලය කුමක් ද ?

පොතේ ගුරා ඒ අවස්ථාවේ දී ඒසව් තමාට හිමි කුලුදුල්කම ගැන උතුම් ආකාරයෙන් සැළකුවේ නෑ. ඔහු යාකොබ් කී ආකාරයට කළා.

..................................................................................................


61Page

පොතේ ගුරා බොහෝ කාලයකට පසුව ඊසාක් වයසට ගොස් තමාගේ පෙනීමත් දුර්වලවඎ ශරීරයත් දුර්වලව සිටි කාලයේ ඊසාක් ඒසව්ට කතා කළා.

ඊසාක් ඒසව්ඎ ඔබ ගිහින් වල් සතෙක්ව දඩයම් කර මා වෙත ගේන්න.
එවිට මම මැරෙන්න කලින්ඎ දෙවියන්වහන්සේගේ ආශිර්වාදය මම ඔබට ලබා දෙනවා.

ඒසව් ඇත්තටමඎ එහෙනම් මම ඉක්මනින්ම යන්නම්.

පොතේ ගුරා ඒසව් දඩයම් කරන්න ඉතාමත් සතුටින් පිටත්ව ගියා.

..................................................................................................


62Page

පොතේ ගුරා මේ වෙලාවේ ඊසාක් විසින් ඒසව්ට කියූ දේ රෙබෙකා අහගෙන සිටියා. රෙබෙකා ඒසව්ට වඩා යාකොබ්ට ආදරේ කළා.

රෙබෙකා මේ ආශිර්වාදය යාකොබ්ට ලැබුණා නම් හොඳයි.

පොතේ ගුරා රෙබෙකා ඉක්මනින්ම යාකොබ්ට කතා කර මේ දේවල් කිව්වා.

**රෙබෙකා** යාකොබ්ෂ ඔයා ඉක්මනින් ගිහින් තාත්තගේ රැළෙන් එළුවෙක් ගේන්න.
මම ඉක්මනින් ඒක රසට හදලා දෙන්නම්.
ඊට පස්සේ ඔයා ඒක ගිහින් තාත්තට දීලාෂ ඔහු මැරෙන්න කලින් මේ ආශිර්වාදය ඔයා ලබා ගන්න.

**යාකොබ්** ඒත් අම්මේෂ ඒසව් ලෝම වලින් පිරුණු කෙනෙක්. මම සුමට ශරීරයක් හිමි කෙනෙක්. මගේ තාත්තා මාව ඇල්ලුවොත් ?
එයා ඉක්මනින්ම දැන ගනීවිෂ මම ඒසව් නොවේ කියලා.

**රෙබෙකා** කරදර වෙන්න එපා. ඒකට ක්‍රමයක් තියෙනවා.

**පොතේ ගුරා** රෙබෙකා ඊසාක් කැමති විදිහට කෑම එක පිළියෙල කළා.
ඉන් පසුව යාකොබ්ටෂ ඒසව්ගේ ඇඳුම් අන්දලා යාකොබ්ගේ අත් වලට හා ශරීරයට එළුවන්ගේ ලෝම හම අන්දවා සූදානම් කළා.

.................................................................................................



62Page

**පොතේ ගුරා** යාකොබ්ෂ අම්මා හදපු රස කෑම එක අරගෙන තාත්තා ළඟට යනවා.

**යාකොබ්** තාත්තේ !

**ඊසාක්** කවුද මේ ?

**යාකොබ්** මම ඒසව්ෂ කරුණාකර නැගිටලා මම ගෙනාපු කෑම කන්න.
කාලා මට ඔබගේ ආශිර්වාදය දෙන්න.

**පොතේ ගුරා** යාකොබ්ෂ මේ සිද්ධිය හසුවේවි’ යි කියා බයෙන් හිටියා.

**ඊසාක්** මගේ ළඟට එන්න. මට ඔයාව අල්ලන්න පුලුවන්ෂ මගේ පුතා.
මට හරියටම දැන ගන්න ඕන මේ ඒසව් ද වෙන කෙනෙක් ද කියලා.

**පොතේ ගුරා** යාකොබ්ගේ තාත්තාෂ ඔහුව ඇල්ලුවා.

**ඊසාක්** ඔයාගේ කටහඬ නම්ෂ යාකොබ්ගේ වගේ.
ඒත් අත් දෙක නම් ඒසව්ගේ වගේ. ඒත් මට වැරදීමක් වෙන්න ඇති.

**පොතේ ගුරා** ඊසාක් බොහෝ වයසට ගොස් සිටි බැවින් ඔහු ඇස් අඳුරුව පෙනීම දුර්වලව සිටියා. ඒ නිසා යාකොබ්ව හඳුනගන්න බැරි වුණා.
ඔහු මේ කතා කරන්නේ ඒසව් සමග බව කියා ඔහු විශ්වාස කළා.
ඊට පසුව කෑම එක කාලා යාකොබ්ට ආශිර්වාද කළා.

.................................................................................................



63Page

**පොතේ ගුරා** ස්වල්ප වේලාවකින් දඩයම රැගෙන ඒසව් ගෙදරට ආවා.
ඔහු රසට කෑම එක හදා ගෙන තාත්තා ළඟට ගෙනාවා.

**ඊසාක්** කවුද මේ ?

**ඒසව්** තාත්තේෂ මම ඔයාගේ පුතා ඒසව්.

**ඊසාක්** මොකක් ද ? මම ඔයාට කලින් ආශිර්වාද කළානේ.

**පොතේ ගුරා** ඒසව්ෂ දුකින්ෂ මහත් ශබ්දයෙන්ෂ කෑ ගසමින් වේදනාවෙන් තික්තකමින් හැඬුවා.

**ඒසව්** තාත්තේ... යාකොබ් මාව දෙපාරක්ම රැවැට්ටුවා.
පළමුව එයා මගේ කුලුඳුල්කම ගත්තා. දැන් එයා මගේ ආශිර්වාදයක් අරගෙන.

| | |
|---|---|
| ඊසාක් | මම යාකොබ්ට ආශිර්වාද කරලා ඉවරයි.<br>මට මොකක්ද දැන් ඔබට දෙන්න පුලුවන් ? |
| පොතේ ගුරා | ඒසව් හයියෙන් අඬලාඝ එයාගේ සහෝදරයා යාකොබ්ට ගොඩාක් වෛර කළා. |
| ඒසව් | තාත්තා මැරුණට පස්සේඝ මම යාකොබ්ව මරණවා. |
| පොතේ ගුරා | ඒසව්ගේ අම්මා ඒසව්ගේ සැලැස්ම අසාගෙන සිටියා.<br>ඒ නිසා ඇය යාකොබ්ට කිව්වාඝ " ඔබ මෙහෙන් පැනලා ගිහින් මාමලා ගෙදර ඉන්න " කියලා. |
| | ........................................................................................ |
| ජිවිතයට අදාල කිරිම | දුවේ පුතේ, කවදාවත් කෙනෙක්ව රවටන්න එපා.<br>කෙනෙක් දේවල් වැරදි විදිහට උදුරා ගන්නත් එපා.<br>එහෙම වුණොත් හැමදාම හැංගිලා තමයි ජීවත්වෙනන් වෙන්නේ.<br>ඒවගේම හය, දුක, හැමවෙලේම අපේ සිතට වදදෙන්නත් යනවා. |